# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2122/14 - 2019 මැයි මස 07 වැනි අඟහරුවාදා - 2019.05.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: YAK/LAN/01/03/16.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/1 5/2017/වීඊ/364.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුව උතුර යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 179/A, නාකියාදෙණිය ග්‍රාම නිලධාරී වසමේ, නාකියාදෙණිය ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අවසන් ගම් පිඹුරු අංක 638 හි අතිරේක අංක 24හි, පත්‍ර අංක 25හි කැබලි අංක 858 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 4.9954 ක් වූ පහත නම් වලින් හා මායිම් වලින් යුත් බිම් කොටස් සම්බන්ධයෙනි.

**කැබලි අංකය 858**

ඉඩමේ නම: තලංගහ වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වටවල වැවිලි සමාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 4.9954.

ඉහත සඳහන් *ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 මැයි මස 29 වැනි දින පෙ.ව 9.00 ට යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2019 මැයි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

චන්දිම සී. මුහන්දිරම්ගේ,
ප්‍රාදේශීය ලේකම්,
යක්කලමුල්ල.

2019 අප්‍රේල් මස 29 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-522